කැලණිය විශ්වවිද්‍යාලය
මානවශාස්ත්‍ර පීඨය - වාග්විද්‍යා අංශය

# දෙමළ ඩිප්ලෝමා පාඨමාලාව

## 2022 වර්ෂය සඳහා අයදුම්පත් කැඳවීම

ඉහත සඳහන් පාඨමාලාව සඳහා අපේක්ෂකයන් ලියාපදිංචි කිරීම පිණිස 2022 ජනවාරි 30 දින සිට 2022 පෙබරවාරි 28 දින තෙක් සම්පූර්ණ කරන ලද අයදුම්පත් භාරගැනීම සිදු කෙරේ.

දෙමළ භාෂාවේ, කථා කිරීම, ලිවීම, අවබෝධය හා පරිවර්තනය කිරීම පිළිබඳ දැනුමක් ලබා එම භාෂාව භාවිත කිරීමට මෙන්ම දෙමළ සංස්කෘතිය පිළිබඳ අවබෝධයක් ලබාගැනීමට අපේක්ෂා කරන අය වෙනුවෙන් මෙම පාඨමාලාව විශේෂයෙන්ම සකස් කර ඇත. 2022 අප්‍රේල් මස සිට මෙම පාඨමාලාවේ දේශන ආරම්භ කිරීමට නියමිත ය.

**පාඨමාලා කාලය** - අධ්‍යයන වර්ෂ එකකි. (සෙනසුරාදා සහ ඉරිදා දිනවල දේශන පැවැත්වෙන අතර මෙම දිනවලින් එක් දිනයක් පමණක් තෝරා ගත යුතුය. රටෙහි පවතින වසංගත තත්වය හේතුවෙන් දේශන මාර්ගගත ක්‍රමයට (online) සහ පන්තිකාමර දේශන වශයෙන් (කැලණිය විශ්වවිද්‍යාලයේ) ද පැවැත්වෙනු ඇත.

**පාඨමාලා ගාස්තුව** - රුපියල් 50,000කි. (රුපියල් පනස්දහසකි) - වාරික දෙකකින් ගෙවිය හැකිය.
(පළමු වාරිකය රු. 30,000/- සහ දෙවන වාරිකය රු.20,000/-)

**අයදුම් කිරීම සඳහා අවම සුදුසුකම්** - අ.පො.ස. (උසස් පෙළ) විභාගය විෂයයන් තුනකින් සමත්වීම
හෝ ඒ හා සමාන සුදුසුකම්
හෝ සේවා අවශ්‍යතාව මත වසර 10ක සේවා පළපුරුද්ද

❍ **"දෙමළ ඩිප්ලෝමා පාඨමාලාව - 2022 අයදුම්පත් ගාස්තුව"** යනුවෙන් සඳහන් කොට කැලණිය විශ්වවිද්‍යාලයේ, අංක 055-1-001-1-0667549 දරන එකතු කිරීමේ ගිණුමට බැර වන පරිදි මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකට රු.750.00 ක් ගෙවා රිසිට් පත ලබා ගත යුතුය. එහි ස්කෑන් පිටපතක් (Scanned copy) අයදුම් පත්‍රයට උඩුගත (Upload) කළ යුතුය.

❍ **අයදුම්පත්‍ර ලබාගන්නා ආකාරය** - ***https://apps.kln.ac.lk/apply_online/dip_tamil*** යන වෙබ් ලිපිනයට පිවිස පාඨමාලා අයදුම්පත සම්පූර්ණ කළ යුතුය.
සැ.යු ***tamild@kln.ac.lk*** යන විද්‍යුත් ලිපිනයට ඔබගේ නම හා දුරකථන අංකය ඇතුළත් විද්‍යුත් පණිවුඩයක් (email) එවීමෙන් හෝ 0112-908786/0112908793 යන දුරකථන අංක ඇමතීමෙන් අයදුම්පත්‍ර සම්බන්ධයෙන් වැඩි විස්තර දැන ගැනීමට හැකිය.

❍ **අයදුම්පත්‍ර යොමු කරන ආකාරය** - මාර්ගගත ක්‍රමයට (Online) අයදුම්පත්‍රය එවූ (Submit) පසු එය බාගත (download) කර ඔබගේ

1. උප්පැන්න සහතිකයේ පිටපතක්
2. ජාතික හැඳුනුම්පතෙහි පිටපතක්
3. උසස් පෙළ විභාග සහතිකයේ පිටපතක්
4. මහජන බැංකුවට රු. 750.00 ක මුදල ගෙවා ලබා ගත් රිසිට් පත සමඟ අමුණා පහත සඳහන් ලිපිනයට එවිය යුතුය. ***"සම්බන්ධීකාරක, දෙමළ ඩිප්ලෝමාව, වාග්විද්‍යා අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය"***

*බඳවා ගනු ලබන විද්‍යාර්ථීන් සංඛ්‍යාව සීමාසහිත බැවින් අසම්පූර්ණ හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප විය හැකිය. අයදුම්පත් ලැබෙන අනුපිළිවෙළ මත ප්‍රමුඛතාව හිමි වේ.*

**ලේඛකාධිකාරී, කැලණිය විශ්වවිද්‍යාලය - 2022.01.30**